# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්‍ෂණය, තෙවන වසර - 2021 (මාර්ගගත)

## දිලික්ත නීතිය
(පෑ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **06**

ප්‍රශ්න තුනකට **(03)** **පමණක්** පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01. ‘අවධානයේ යුතුකම’ (Duty of Care) සහ ‘නීතිවිරෝධීභාවය’ (Unlawfulness) යන සංකල්ප, විවිධ නීති පද්ධතීන් යටතේ, සමාන්තරව ආරම්භ වී, වර්ධනය වී ඇතත්, ‘අවධානයේ යුතුකම’ හා සසඳන විට, ‘නීතිවිරෝධීභාවය’ යන සංකල්පය වඩා පුළුල් වේ.

අදාළ නඩු තීන්දු නීතිය ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

02. ශ්‍රියානි, අවුරුදු 25ක් වයසැති නිරෝගී, ගැබිනි කාන්තාවකි. එන්නත් කිරීම් සහ ඒ සම්බන්ධ ක්‍රියා පටිපාටියට ඇය අතිශය සංවේදී ය. කොවිඩ් 19 (Covid19) වසංගතය සහ එහි වේගවත් පැතිරීම හේතුවෙන්, ඇයට එන්නත ලබා ගැනීම හැර වෙනත් කිසිදු විකල්පයක් නොමැත. ඇය දිගින් දිගටම එන්නත ලබා ගැනීම ප්‍රතික්ෂේප කළත්, ඇයට දැඩි සෞඛ්‍ය අවදානමක් නොමැති නම්, එන්නත ලබා ගැනීමේ වැදගත්කම පිළිබඳව ඇය පදිංචි ප්‍රදේශයේ එන්නත් භාර වෛද්‍යවරයා විසින් ඇයට උපදෙස් දුන්නේය. එන්නත ලබා දීමට නියමිත දිනයේ ශ්‍රියානි කනස්සල්ලෙන් හා සිත් තැවුලෙන් සිටි බැවින් අසාමාන්‍ය ලෙස හැසිරුණි. ඇගේ අසාමාන්‍ය හැසිරීම සැලකිල්ලට ගෙන, එය එන්නත් කිරීම් සම්බන්ධයෙන් ඇයට ඇති බිය හේතුවෙන් යැයි අවංකව සිතා, වෛද්‍යවරයා ඇගේ අවධානය වෙනතකට යොමු කිරීමට උත්සාහ කළේය. එන්නත ලබා දීම සඳහා ඇයගේ අවධානය වෙනතකට යොමු කරමින්, ශ්‍රියානිගේ සැමියාට කොවිඩ් 19 (Covid19) රෝගය වැළඳී ඇති බව පරීක්ෂණයෙන් තහවුරු වී ඇති බැවින්, ඔහුව රෝහලට ඇතුළත් කළ බව වෛද්‍යවරයා ඇයට දන්වා සිටියේය. එය ඇසූ විගසම ශ්‍රියානි ක්ලාන්ත වූ අතර, පසුව අනාවරණය වූයේ, ඇයට ස්නායු කම්පනයක් සිදු වූ බවත්, එයින් ඇයට ගබ්සාවක් සිදු වූ බවත්ය. තමාට කොවිඩ් 19 (Covid19) එන්නත

ලබා දුන් වෛද්‍යවරයාට එරෙහිව නඩු පැවරීමට ශ්‍රියානි අපේක්ෂා කරයි. ඇයට සිදුවූ ගබ්සාවට වෛද්‍යවරයා වගකිව යුතු බවට ඇය කියා සිටියි.

අක්විලියානු නඩුකරයට අදාළ නෛතික මූලධර්ම මත පදනම්ව, මෙම තත්ත්වය විවේචනාත්මකව විශ්ලේෂණය කරමින් ඔබගේ පිළිතුර පිළියෙළ කරන්න.

03. දිලික්ත නීතිය යටතේ එන නොසැලකිල්ල පිළිබඳ නීතිය, සීමාවන්ට යටත්ව, නඩු මගට පිවිසෙන්නන්ගේ එකිනෙකට තරඟකාරී අවශ්‍යතාවන් තුලනය කිරීම වටා ක්‍රියාත්මක වේ. එය සාක්ෂාත් කර ගැනීම සඳහා, වසර ගණනක් මුළුල්ලේ අධිකරණය, ඔවුන්ටම ආවේණික ප්‍රවේශයන් නිර්මාණය කර ඇත. සාම්ප්‍රදායිකව රයිලන්ඩ්ස් එදිරිව ෆ්ලෙචර් (Rylands v Fletcher) රීතිය යටතේ හෝ කරදරය යටතේ සලකනු ලැබූ දිලික්තයන්, පූර්වේක්ෂණය නම් මූලධර්මය හරහා නොසැලකිල්ල පිළිබඳ නීතිය යටතේ ආවරණය කිරීම මගින්, නොසැලකිලිමත්කමේ විෂය පථය පුළුල් කිරීමට මෑත කාලීන එංගලන්ත අධිකරණයන් දැඩි උනන්දුවක් දක්වා ඇත.

අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු නීතිය ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න.

04. කොවිඩ් 19 (Covid19) වසංගතයේ සීඝ්‍ර ව්‍යාප්තිය හේතුවෙන්, රෝහල් සහ අනෙකුත් සෞඛ්‍ය සේවා සැපයුම් පහසුකම් රෝගීන්ට සැලසීමට තවදුරටත් නොහැකි විය. කොවිඩ් 19 (Covid19) ආසාදනය වූ රෝගීන්ට නවාතැන් ලබා දීමට පවතින බලවත් අවශ්‍යතාවය සපුරාලීම සඳහා, අනිකුත් හෝටල් අතර, "ඩන්කන් හෝටලය" (Hotel Duncan) ද රජයේ අනුමත, පෞද්ගලික නිරෝධායන සහ සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථානයක් ලෙස ඔවුන්ගේ සේවාවන් සැපයීමට තීරණය කරන ලදි. හෝටලයේ බටහිර අංගනය අලුත්වැඩියා වෙමින් පැවතියද, කොවිඩ් 19 (Covid19) ආසාදනය වූ රෝගීන්ගේ සීග්‍ර වැඩිවීමත් සමඟ, හෝටල් කළමනාකාරීත්වය තීරණය කළේ එහි, රෝගීන්ට නවාතැන් පහසුකම් ලබා දීමට ය. හෝටලයේ සභාපතිවරයා, එහි අයිතිකරුද වන අතර, ඔහු ගිවිසුම්කරුවන්ට දන්වා සිටියේ අලුත්වැඩියා කටයුතු නිම කිරීමට එකඟ වූ කාලසීමාව දැනටමත් පසුව ඇති බැවින්, එම කටයුතු කඩිනමින් අවසන් කරන ලෙසයි. නිසි ක්‍රමවේදය අනුගමනය කලේ නම් එම කාර්යයන් නිම කිරීමට අමතර කාලයක් අවශ්‍ය වුවද, අදාළ අලුත්වැඩියාවන් අවසන් කිරීමට ගිවිසුම්කරුවන් සමත් විය. අලුත්වැඩියාවන් අවසන් වූ පසුව, එම හෝටලයේ බටහිර අංගනයේ බොහෝ රෝගීන්ට නවාතැන් දෙන ලදී. රෝගීන් කිහිප දෙනෙකු ප්‍රතිකාර ලබමින් සිටියදී, දිනක්, බටහිර අංගනයේ ප්‍රධාන බිත්තිය කඩා වැටී එක එල්ලේම රෝගීන් මතට වැටුණි. එහි ප්‍රතිපලයක් වශයෙන්, හෝටලයේ බටහිර අංගනයේ ප්‍රතිකාර ලබමින් සිටි 35 දෙනෙකුගෙන් 30 දෙනෙකු බරපතල තුවාල ලැබූ අතර, ඉතිරි 05 දෙනා මියගිය බවට

වාර්තා විය. එම හෝටලයේ සභාපතිවරයා මාධ්‍ය වෙත ප්‍රකාශ කර සිටියේ, මියගිය බවට වාර්තා වූ පුද්ගලයින් 05 දෙනාගේ ජීවිත අහිමි වූයේ කොවිඩ් 19 (Covid19) ආසාදනය වීම හේතුවෙන් බැවින්, ඔවුන්ගේ මරණවලට හෝටලය වගකිව යුතු නොවන බවයි. තවද, එහි අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලැබුවේ තමන් නොව ගිවිසුම්කරුවන් විසින් වන බැවින්, සෙසු 30 දෙනාට සිදුවූ තුවාල පිළිබඳ වගකීම තමාට භාරගත නොහැකි බවට සභාපතිවරයා ප්‍රකාශ කරයි.

ඔබේ පිළිතුරෙන් ඉහත ගැටලුවට අදාළ වන නීතිය විශ්ලේෂණය කිරීම අවශ්‍ය වේ. අවශ්‍ය අවස්ථාවලදී, නඩු තීන්දු නීතිය සහ ව්‍යවස්ථාපිත විධිවිධාන උපුටා දක්වන්න.

05. අවුරුදු 10ක් වයසැති නිලාගේ මව ශාරධා ය. නිලාගේ උපන්දිනය සැමරීම සඳහා ශාරධා, ‘සෝල්ට් ඇන්ඩ් පෙපර්’ (Salt and Pepper) ආහාර ඇනවුම් කිරීමේ ජංගම මෘදුකාංගය (food app) හරහා ‘ලකී බේකර්ස්’ (Lucky Bakers) වෙතින් කේක් කිලෝ 3ක් සඳහා ඇනවුමක් කළාය. ලකී බේකර්ස් (Lucky bakers) හට දශක තුනක වෙළඳපල ස්ථාවරයක් ඇති අතර, ඔවුන් බේකරි අයිතම සඳහා නගරයේ බෙහෙවින් ප්‍රසිද්ධය. ‘සුභ උපන්දිනයක් කුමරිය’ (Happy Birthday Princess) යනුවෙන් අයිසිං ආශ්‍රයෙන් සුබපැතුමක් කේක්ගෙඩිය මත තබන ලෙසට ශාරධා අලෙවිකරුට උපදෙස් දුන්නාය. කේක්ගෙඩිය භාර දුන් අවස්ථාවේදී, අයිසිං සුබපැතුම නොමැති බව ශාරධා දුටුවාය. ඒ පිළිබඳව විමසීම සඳහා ඇය වහාම 'සෝල්ට් ඇන්ඩ් පෙපර්' (Salt and Pepper) ක්ෂණික ඇමතුම් අංකයට ඇමතුමක් ලබා ගන්නා ලදී. ශාරධාට උපදෙස් ලබා දෙමින් පාරිභෝගික සේවා විධායකවරයා දන්වා සිටියේ, ආහාර ද්‍රව්‍ය ආපසු බාර ගැනීමේ ප්‍රතිපත්තියක් ඔවුන් සතුව නොමැති බවත්, එබැවින්, ආහාර ඇනවුම් කිරීමේ ජංගම මෘදුකාංගය හරහා (Food app) පැමිණිල්ලක් කරන ලෙසත්, වැඩ කරන දින පහක් ඇතුළත එය විසඳන බවත්ය. පැමිණිල්ල ඉදිරිපත් කිරීමෙන් පසුව, ශාරධා අයිසින් තැවරුම (icing topping) නොමැති කේක්ගෙඩිය බාර ගත්තාය.

උපන් දින සැමරුමෙන් පසුව, ශාරධා ඔවුන්ගේ අසල්වැසියන් වන රවී සහ සෘති සමඟ කේක් කෑලි කිහිපයක් බෙදා ගත්තාය. පසුදින, ශාරධාට සහ නිලාට පාචනය සහ සමේ ආසාත්මිකතාවයක් හටගත් බැවින් ප්‍රතිකාර සඳහා රෝහලට ඇතුළත් කරන ලදී. ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය අයහපත් වීමට හේතුව නිලාගේ උපන්දිනය දවසේ ඔවුන් ආහාරයට ගත් නරක් වූ ආහාර නිසා බව වෛද්‍යවරු සොයා ගත්හ. රවීට සහ සෘතිට ද සුළු අපහසුතාවන් තිබූ බව ශාරධාට දැනගන්නට ලැබිණි.

නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ශාරධා අපේක්ෂා කරයි. ඇය ඔබගේ උපදෙස් පතයි. නඩු තීන්දු නීතිය සහ අදාළ ව්‍යවස්ථාපිත අධිකාරීන් ආශ්‍රයෙන් ඇයට උපදෙස් දීම ඔබෙන් බලාපොරොත්තු වේ.

06. සිරිනන්ද මහතා වසර 15කට අධික කාලයක් කැබිනට් අමාත්‍යවරයකු ලෙස කටයුතු කරන දේශපාලනඥයෙකි. ඔහු තිරසාර පරිසර අමාත්‍යාංශයේ (Ministry of Sustainable Environment) අමාත්‍යවරයා ලෙස එහි මුලසුන ගෙන කටයුතු කරන විට, ජෛව විවිධත්වය සඳහා පිළිගත් ප්‍රදේශයක සිදුවන වනහායනය පිළිබඳ ප්‍රශ්නයක් මතු විය. ඔහුට එල්ල වී ඇති චෝදනා වන්නේ, සංචාරක හෝටලයක් ඉදිකිරීම සඳහා එම ප්‍රදේශය විදේශිකයෙකුට විකිණීමට කුමන්ත්‍රණය කරඇති බවත්, එමගින් තිරසාර පරිසර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා ලෙස තමාට හිමි බලතල අවභාවිත කරමින් කටයුතු කර ඇති බවත්ය. මාධ්‍යවේදීන් කිහිප දෙනෙකු විසින් මතු කරන ලද ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඔහු කිහිප වතාවක්ම රූපවාහිනියේ පෙනී සිටි අතර, එහිදී ඔහු තමාට එරෙහිව කරන ලද එම චෝදනාවන් තරයේ ප්‍රතික්ෂේප කරන ලදී. කෙසේ වුවත්, කලකට පසුව " දූෂිත දේශපාලනය සහ තිරසාර පරිසරයක අහිමි වූ බලාපොරොත්තුව" (Political corruption and the Lost Hope of a Sustainable Environment ) නමින් වාර්තා චිත්‍රපටයක් ජාතික හා ජාත්‍යන්තර මාධ්‍යවල සංසරණය විය. එම වාර්තා චිත්‍රපටයේ, "සිරි" නම් වූ දූෂිත දේශපාලකයෙකු නිරූපණය කරන සජීවිකරණය කරන ලද, විකට චිත්‍රයක් ප්‍රදර්ශනය කරන ලදී. එම සජීවිකරණය කරන ලද චරිතය, විකෘති රූපයක් වූ අතර, එය සිරිනන්ද ඇමැතිවරයාට එරෙහිව ඇති චෝදනා අර්ධ වශයෙන් නිරූපණය කරන ලදී. මෙම වාර්තා චිත්‍රපටිය ඔහුට දැඩි සමානකමක් දක්වන බවට විශ්වාස කරන සිරිනන්ද මහතා අපේක්ෂා කරන්නේ, එය නිර්මාණය කිරීම සම්බන්ධයෙන් "පෘථිවියේ සාමය" (Peace of Earth) සංවිධානයට එරෙහිව නඩුවක් ගොනු කිරීමටයි. එම දූෂිත ක්‍රියාවන්ට අදාල ප්‍රකාශ හුදු චෝදනා පමණක් වන හෙයින්, ඒවාට ඔහු වගකිව යුතු නොවුනත්, මහජනතාව විසින් ඔහු එම ක්‍රියාවන්ට වගකිව යුතු බවට හඳුනාගනු ඇතැයි යන්න පිළිබඳව සැලකිලිමත් වෙයි.

"පෘථුවියේ සාමය" (Peace of Earth) සංවිධානය විසින් ඔවුන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම සඳහා ඔබගේ සේවය ලබා ගත් බවට උපකල්පනය කරන්න. මෙම නීති ක්ෂේත්‍රයට අදාල වන ඉංග්‍රීසි නීතියේ සහ රෝම ලන්දේසි නීතියේ සැලකිය යුතු ලක්ෂණ ආශ්‍රයෙන් මෙම ගැටළුව විශ්ලේෂණය කරන්න. අවශ්‍ය අවස්ථාවලදී නඩු තීන්දු නීතිය උපුටා දැක්වීමද ඔබෙන් බලාපොරොත්තු වේ.

(සෑම ප්‍රශ්නයක්ම ලකුණු 100න් ලකුණු කරනු ලැබේ.)

*****